**2024-07-22 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල
රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය**

වත්මන් සමාජ ආරක්ෂණ පද්ධතියට ඒකාබද්ධ වී තිබෙන, එකිනෙකට සම්බන්ධයක් නොමැති වැඩසටහන්, යෝජනා ක්‍රම, ආයතන සහ නිමැවුම් මඟින් එකී සමාජ ආරක්ෂණ ක්‍රියාවලියේ පවත්නා සීමිත කාර්යක්ෂමතාවය හා ජාතික සංවර්ධනයට දක්වන දායකත්වය අඩු බව පෙන්නුම් කරයි. ඒ අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාව සඳහා ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියක අවශ්‍යතාවය හඳුනා ගනු ලැබ ඇත. ඒ සඳහා අදාළ සියලුම පාර්ශ්වයන්ගේ දායකත්වයෙන්, මනා සම්බන්ධීකරණය හා අනුරූපී බව සහිත සමාජ ආරක්ෂණ පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා ක්‍රමෝපායික මග පෙන්වීමක් ලබා දීමට ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය සකස් කර තිබේ. එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

**02. දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා පිළියෙල කිරීම**

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය හා පැරිස් ගිවිසුම අනුව, ශ්‍රී ලංකාව විසින් දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික සන්නිවේදන වාර්තා සකස් කර එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව, පළමු ද්විවාර්ෂික විනිවිදභාවය පිළිබඳ වාර්තාව 2024-12-31 දින වන විටත්, දෙවන ද්විවාර්ෂික විනිවිදභාවය පිළිබඳ වාර්තාව 2026-12-31 දින වන විටත් ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. එසේම, ශ්‍රී ලංකාව සිය සිව්වන ජාතික සන්නිවේදන වාර්තාව 2027 වර්ෂයේදී ඉදිරිපත් කළ යුතු වේ. 2024-2028 කාලසීමාව තුළ එකී වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට අදාළව අවශ්‍ය අරමුදල් සලසා ගැනීම පිණිස පරිසර අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති වාර්තාවක් ගෝලීය පරිසර පහසුකම වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. එකී ව්‍යාපෘති වාර්තාව මත පදනම්ව අදාළ වාර්තා සකස් කිරීම සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 1.23ක ප්‍රදානයක් ලබා දීමට ගෝලීය පරිසර පහසුකම එකඟතාව පළ කර තිබේ. එකී



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

ප්‍රදානය ලබා ගැනීම සඳහා අදාළ ගිවිසුම්වලට එළඹීම පිණිස පරිසර අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. දේශීය වෛද්‍ය විද්‍යාපීඨයේ නේවාසිකාගාර අවශ්‍යතා සඳහා කොළඹ විශ්වවිද්‍යාලය වෙත ඉඩම් කොටසක් පවරා දීම**

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාර අවශ්‍යතාව සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ හෙක්ටයාර 0.1765ක් පමණ වූ ඉඩම් කොටසක් සහ එහි පිහිටි ගොඩනැගිලි අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අවුරුදු 50ක බදු පදනම මත එවකට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා දී ඇත. 2023-02-13 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨයක් බවට පත් කරනු ලැබ ඇති අතර, එම පීඨය විසින් අදාළ ඉඩම ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාර පවත්වාගෙන යාම සඳහා යොදා ගත යුතු බවට තීරණය කරනු ලැබ තිබේ. ඒ අනුව, අංක 330, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත, කොළඹ 08 පිහිටි ඉඩම් කොටස එම පීඨයේ ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාර අවශ්‍යතා සඳහා යොදා ගැනීමට හැකි වන පරිදි කොළඹ විශ්වවිද්‍යාලය වෙත පවරා දීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ඩිප්ලෝමා පාඨමාලා උපාධි පාඨමාලා තත්ත්වයට ඉහළ නැංවීම**

කටුනායක, තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ 1985 දී ආරම්භ කරනු ලැබ ඇති අතර, එය 2006 වසරේ සිට ඉංජිනේරු තාක්ෂණ ආයතනය ලෙස ස්ථාපිත කරනු ලැබ ඇත. එම ආයතනය විසින් වසර 04ක අධ්‍යයන කාලය සම්පූර්ණ කරන සිසුන් වෙත ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලබයි. එකී ඩිප්ලෝමාව, ඉංජිනේරු තාක්ෂණ උපාධියක් දක්වා ඉහළ නැංවීම පිණිස වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය විසින් එකඟතාවකට එළඹ ඇත. ඒ අනුව, ඉංජිනේරු තාක්ෂණ උපාධිය පිරිනැමීම සඳහා එම ආයතන දෙක අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. තාවකාලික ආනයන හා අපනයන යෝජනා ක්‍රමය යටතේ මුදවන ලද රබර් කිරි සහ රබර් ෂීට් ආනයනය කිරීම**

ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන සහ ටයර් නිෂ්පාදන කර්මාන්තශාලා සඳහා තාක්ෂණික පිරිවිතර රබර් මෙට්‍රික්ටොන් 60,240ක පමණ වූ වාර්ෂික ඉල්ලුමක් ඇති අතර, රට තුළ පවතින උග්‍ර ඔට්ටපාලු හිඟය හේතුවෙන් දේශීය නිෂ්පාදකයන්ට එම ඉල්ලුම සපුරාලිය නොහැකි තත්ත්වයක් උද්ගතව ඇත. ඒ අනුව, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ සහ ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලැබූ ශ්‍රී ලාංකික තාක්ෂණික පිරිවිතර රබර් නිෂ්පාදන ආයතන සඳහා අවශ්‍ය මුදවන ලද රබර් කිරි සහ මුදවන ලද රබර් කිරිවලින් අඹරා සාදන ලද Sheets අපනයන කාර්යයන් සඳහා තාවකාලිකව ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය (TIEP) යටතේ ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. මහරගම, තලපත්පිටිය, නව රෝහල පාරේ පැරණි ඇළ මාර්ග පිහිටි ඉඩම් කොටස් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම**

මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තලපත්පිටිය ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 27.5ක ඉඩම් කොටසක් 1984 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දී ඇත. එහෙත්, එකී ඉඩමේ මහරගම, තලපත්පිටිය, නව රෝහල පාරේ පිහිටි දැනටමත් සංවර්ධනය කරනු ලැබ ඇති පැරණි ඇළ මාර්ග දැක්වෙන ඉඩම් කොටස් නාගරික සංවර්ධන අධිකාරිය වෙත විධිමත්ව පැවරී නොමැත. ඒ අනුව, එම ඉඩමේ පැරණි ඇළ මාර්ග දැක්වෙන ඉඩම් කොටස් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගාස්තු අය කිරීමකින් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් පවරා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. බේරේ වැව, කුරුලු දූපත පිහිටි ඉඩම් කොටස සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ජිනරතන භික්ෂු අභ්‍යාස විද්‍යාලය කාරක සභාව වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීම**

2000 වර්ෂයේදී කොළඹ නගර සංවර්ධන සැලැස්මේ කොටසක් ලෙස බේරේ වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිරිතදිග බේරේ වැවේ පිහිටි පර්චස් 143ක් පමණ වූ කුරුලු උයන දූපත නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගෙන තිබේ. දැනට ඌන උපයෝජිත තත්ත්වයේ

පවතින එකී ඉඩම් කොටස බෞද්ධ පුදබිමක් ලෙස හා සංස්කෘතික උරුමයන් ප්‍රදර්ශනය කෙරෙන සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා යොදා ගැනීම පිණිස ගංගාරාම විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් ඉල්ලීමක් ඉදිරිපත් කොට ඇත. ඒ අනුව, එකී ඉඩම් කොටස සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ජිනරතන භික්ෂු අභ්‍යාස විද්‍යාලය භාරක සභාව වෙත රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරනු ලබන බදු වටිනාකම මත පදනම්ව අවුරුදු 50ක කාලසීමාවක් සඳහා බදු පදනම මත ලබා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **COVID-19 වසංගතය අතරතුර ශ්‍රී ලංකාව තුළ බලාත්මක කරන ලද අනිවාර්ය ආදාහන ප්‍රතිපත්තිය සම්බන්ධව සමාව අයැදීම**

COVID-19හි සායනික කළමනාකරණය පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගෝපදේශවල සඳහන් පරිදි, වෛරසයට ගොදුරු වී මියගිය තැනැත්තන්ගේ මෘතදේහ බැහැර කිරීමේ ක්‍රමවේදය ලෙස ආදාහනය නිර්දේශ කරනු ලැබ තිබුණි. ඒ අනුව, COVID-19ට ගොදුරු වූ මුස්ලිම් ජාතික පුද්ගලයින් 276 දෙනෙකුගේ මෘතදේහ ආදාහනය කර ඇති අතර, පසුව 2021 පෙබරවාරි මාසයේදී එවැනි පුද්ගලයින් සඳහා දැඩි සීමාවන් සහිතව භූමදානය කිරීමට අවසර ලබා දී ඇත. 2021 ජූලි මාසයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහාය ඇතිව එවකට ජලසම්පාදන අමාත්‍යාංශය විසින් ගංගා ජලය, රෝහල්වලින්, නිරෝධායන මධ්‍යස්ථානවලින් හා වෙනත් විභව ක්ෂේත්‍රයන්ගෙන් බැහැර කරනු ලබන අපජලය ඇතුළත්ව කොළඹ මහනුවර ජලජ පරිසරවල SARS-CoV-2 වෛරසය හඳුනා ගනු ලැබීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. එම අධ්‍යයනය මඟින් මතුපිට ජලයෙහි කිසිදු වෛරසයක් නොමැති බව අනාවරණය වී තිබේ. 2024 මාර්තු මාසයේදී ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ජල තාක්ෂණය සඳහා චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ සහ ආදර්ශන මධ්‍යස්ථානය විසින් දෙවන අධ්‍යයනයක් ද සම්පූර්ණ කරනු ලැබ ඇති අතර, එමඟින් SARS-CoV-2 වෛරසය භූගත ජලය ඇතුළු ජල මූලාශ්‍ර වෙත සම්ප්‍රේෂණය වීමේ මූලික ප්‍රභවය මළ හා මුත්‍රා මඟින් මිස ආරක්ෂිත භූමදානයන් මඟින් නොවන බවට තහවුරු වී ඇත. ඒ අනුව, COVID-19 වසංගතය අතරතුර ශ්‍රී ලංකාව තුළ බලාත්මක කරන ලද අනිවාර්ය ආදාහන ප්‍රතිපත්තිය හේතුවෙන් බලපෑමට ලක් වූ සමාජ කොටස්වලින් ශ්‍රී ලංකා රජය විසින් සමාව අයැදීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ

අමාත්‍යතුමා, විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ආගමික අභිමතය පරිදි භූමදානය කිරීම සහ ආදාහනය කිරීම පිළිබඳ යෝජිත පනත**

COVID-19හි සායනික කළමනාකරණය පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගෝපදේශවල සඳහන් පරිදි, වෛරසයට ගොදුරු වී මියගිය තැනැත්තන්ගේ මළසිරුරු ආදාහනය කිරීම අනිවාර්ය කරන ලදී. මෙම තීරණය විවිධ ආගමික කණ්ඩායම්වල සහ මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ මෙන්ම විශේෂයෙන්ම මුස්ලිම් ආගම අදහන තැනැත්තන්ගේ කනස්සල්ලට හේතු විය. ඒ සම්බන්ධයෙන් පසුව සිදු කරන ලද අධ්‍යයනයන්ට අනුව COVID වෛරසය භූගත ජලය ඇතුළු ජල මූලාශ්‍ර වෙත සම්ප්‍රේෂණය වීමේ මූලික ප්‍රභවය මළ හා මුත්‍රා මඟින් මිස ආරක්ෂිත භූමදානයන් මඟින් නොවන බවට තහවුරු වී තිබේ. එබැවින්, ඉදිරියේදී එවැනි තත්ත්වයන් මඟහරවා ගැනීම පිණිස යම් තැනැත්තෙකුට හෝ ඥාතියෙකුට සිය අභිමතය පරිදි මියගිය තැනැත්තාගේ භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම හෝ තෝරා ගැනීමට ඉඩ සලසන නීතියක් හඳුන්වා දීම කෙරෙහි අවධානය යොමු වී තිබේ. එසේම, අවශ්‍ය නම් වෛද්‍ය පීඨවලට සිරුරු පරිත්‍යාග කිරීම සඳහා අදාළ නීති හඳුන්වා දීම යෝග්‍ය බව ද පෙනී ගොස් ඇත. ඒ අනුව, නව නීතියක් හඳුන්වා දීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ පවත්වා ගෙන යාම**

මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ කළමනාකරණය කිරීම පිණිස රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික නියෝජිතායතනයේ නිර්දේශ ලබා ගැනීමට 2023-05-02 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. ඒ අනුව, එකී නියෝජිතායතනයේ නිර්දේශ මත පදනම්ව මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා සුදුසු ආයෝජකයෙකු හඳුනා ගැනීම පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමටත්, හඳුනාගනු ලබන ආයෝජකයා සමඟ වසර 30ක කාලයක් සඳහා බදු ගිවිසුමකට එළඹීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **2024-2027 දක්වා වූ වර්ෂ තුළ ලංකා නැව් සංස්ථාවට අයත් වියළි තොග ප්‍රවාහන යාත්‍රා සේවයෙහි යෙදවීම**

සීමාසහිත ලංකා නැව් සංස්ථාව සතු Mv. Ceylon Breeze සහ Mv. Ceylon Princess යාත්‍රා 2024/2025 සිට 2026/2027 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා කාල කුලී පදනම මත කුලියට දීම සහ එහි වාණිජ කළමනාකරණය යන කාර්යයන් වෙනුවෙන් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 02ක් ලැබී ඇති අතර, එම ලංසු ඇගයීමෙන් අනතුරුව තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව වසර 03ක කාලයකට M/s Wallem Shipping (Singapore) Pte Ltd වෙත අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ නිරත කාන්තාවන් හා තරුණ ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම**

අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ නිරත ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස 2024 අයවැය මඟින් කර්මාන්ත අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 300ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත. ඒ අනුව, අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ නිරත කර්මාන්තකරුවන් මුහුණ දෙන අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටලු, ව්‍යවසායකත්ව කුසලතා අවම වීම, පරිසර හිතකාමී හා ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති වීම, වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන ගුණාත්මක නිෂ්පාදන බිහි නොවීම හා ප්‍රමාණවත් අලෙවි පහසුකම් නොමැති වීම යන ගැටලුවලට විසඳුම් ලබා දීම සඳහා ඒකාබද්ධ ව්‍යාපෘති යෝජනාවක් සකස් කරනු ලැබ ඇති අතර, ඒ සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලැබී තිබේ. ඒ අනුව, එකී ව්‍යාපෘති යෝජනාව මඟින් හඳුනාගනු ලැබ ඇති සංවර්ධන වැඩසටහන් කර්මාන්ත

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා සුදුසු ආයෝජකයෙකු හඳුනා ගැනීම පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමටත්, හඳුනාගනු ලබන ආයෝජකයා සමඟ වසර 30ක කාලයක් සඳහා බදු ගිවිසුමකට එළඹීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 11. 2024-2027 දක්වා වූ වර්ෂ තුළ ලංකා නැව් සංස්ථාවට අයත් වියළි තොග ප්‍රවාහන යාත්‍රා සේවයෙහි යෙදවීම

සීමාසහිත ලංකා නැව් සංස්ථාව සතු Mv. Ceylon Breeze සහ Mv. Ceylon Princess යාත්‍රා 2024/2025 සිට 2026/2027 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා කාල කුලී පදනම මත කුලියට දීම සහ එහි වාණිජ කළමනාකරණය යන කාර්යයන් වෙනුවෙන් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 02ක් ලැබී ඇති අතර, එම ලංසු ඇගයීමෙන් අනතුරුව තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව වසර 03ක කාලයකට M/s Wallem Shipping (Singapore) Pte Ltd වෙත අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 12. අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ නිරත කාන්තාවන් හා තරුණ ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ නිරත ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස 2024 අයවැය මගින් කර්මාන්ත අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 300ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත. ඒ අනුව, අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ නිරත කර්මාන්තකරුවන් මුහුණ දෙන අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටලු, ව්‍යවසායකත්ව කුසලතා අවම වීම, පරිසර හිතකාමී හා ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති වීම, වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන ගුණාත්මක නිෂ්පාදන බිහි නොවීම හා ප්‍රමාණවත් අලෙවි පහසුකම් නොමැති වීම යන ගැටලුවලට විසඳුම් ලබා දීම සඳහා ඒකාබද්ධ ව්‍යාපෘති යෝජනාවක් සකස් කරනු ලැබ ඇති අතර, ඒ සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලැබී තිබේ. ඒ අනුව, එකී ව්‍යාපෘති යෝජනාව මගින් හඳුනාගනු ලැබ ඇති සංවර්ධන වැඩසටහන් කර්මාන්ත

අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, පේෂකර්ම දෙපාර්තමේන්තුව, ලංකා සළුසල ආයතනය හා ජාතික මෝස්තර මධ්‍යස්ථානය යන ආයතන මඟින් ක්‍රියාත්මක කිරීම පිණිස කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**13. ගඩලාදෙණිය සද්ධර්මතිලක රජමහා විහාරයේ 'ගෙඩිගේ' සම්ප්‍රදායේ පිළිමගෙය ආරක්ෂා කිරීම**

ගඩලාදෙණිය සද්ධර්මතිලක රජමහා විහාරය පල්ලව ගෘහනිර්මාණ ශිල්පයට අනුව ගම්පොල යුගයේදී ධර්මකීර්ති නම් හිමිනමකගේ මූලිකත්වයෙන් ඉදි කරන ලද්දකි. එම රජමහා විහාරයේ ගෙඩිගේ සම්ප්‍රදායට අයත් පිළිමගෙය සංරක්ෂණය කිරීමේ කාර්යය සඳහා ආවරණ වහළක් ඉදි කිරීමට යෝජනා වී ඇත. ඒ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තුළ අවශ්‍ය මානව සම්පත් හා තාක්ෂණික උපකරණ නොමැති බැවින්, ඒ සඳහා හැකියාව සහ සම්පත් සහිත ආයතනයක් වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත එම කාර්යය පැවරීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**14. බදු අභියාචනා ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධන කිරීම**

දේශීය ආදායම් පනතේ විධිවිධාන පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තීරණයක් පිළිබඳ අතෘප්තියට පත් වන යම් බදු ගෙවන්නෙකුට එම තීරණය පිළිබඳ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වේ. ඒ සම්බන්ධයෙන් වන සිය තීරණය වසර 02ක් නොඉක්ම වීමට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් ලබා දිය යුතු වේ. එකී තීරණය පිළිබඳව ද අතෘප්තියට පත් වන යම් බදු ගෙවන්නෙකුට එම තීරණය සමාලෝචනය කිරීම සඳහා බදු අභියාචනා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කිරීමට හැකියාව පවතින අතර, එවැනි සමාලෝචන ඉල්ලීමක් ලැබුණු දිනයේ සිට බදු අභියාචනා කොමිෂන් සභාවේ තීරණය දින 270ක් තුළ ලබා දිය යුතු වේ. ඒ අනුව, එකී අභියාචන ක්‍රියාවලිය සඳහා වසර තුනකට ආසන්න කාලයක් ගත විය හැකි අතර, ඒ හේතුවෙන් පසුගිය කාලය තුළ රුපියල් බිලියන 73ක පමණ බදු මුදලක් රාජ්‍ය ආදායමට අය කර ගැනීමට නොහැකිව පවතී. එම කරුණු සැලකිල්ලට ගෙන, බදු අභියාචනා ක්‍රියාවලිය කඩිනම් කිරීම සහ විධිමත් කිරීම සඳහා 2017 අංක 24 දරන

දේශීය ආදායම් පනතට යෝග්‍ය සංශෝධන හඳුන්වා දීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **යෝජිත "ජාතික චිත්‍රපට සංවර්ධන කොමිෂන් සභාව" වෙනුවට "Films Sri Lanka" යන නමින් නියාමන ආයතනයක් ස්ථාපිත කිරීම**

ජාතික චිත්‍රපට සංස්ථාව වර්තමානයේ සිදු කරනු ලබන ව්‍යාපාරික කටයුතුවලින් ඉවත් වී නියාමනය මූලික කර ගත් කටයුතු සිදු කිරීමටත්, ඩිජිටල් වේදිකාවට අවතීර්ණ වීමට පවතින අවස්ථා සහ පහසුකම් සලසා දීමටත්, එමගින් දේශීය සිනමාව ජාත්‍යන්තරයට යොමු කිරීමටත් හැකි වන අයුරින් නව ආයතනික රාමුවක් ස්ථාපිත කරලීම පිණිස "ජාතික චිත්‍රපට සංවර්ධන කොමිෂන් සභාව" පිහිටුවීම සඳහා ඉදිරිපත් කළ යෝජනාව, 2024-04-29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගන්නා ලදී. එහිදී, එම යෝජනාව පිළිබඳව චිත්‍රපට කර්මාන්තයේ නියුතු සියලු පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර අදහස් ලබා ගත යුතු බවට තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, අදාළ පාර්ශ්වයන් සමඟ පැවති සාකච්ඡාවේදී ඉදිරිපත් වී ඇති කරුණු මත පදනම්ව "ජාතික චිත්‍රපට සංවර්ධන කොමිෂන් සභාව" වෙනුවට එහි නාමය "Films Sri Lanka" ලෙස නම් කිරීමටත්, යෝජිත පනත් කෙටුම්පත සකස් කිරීමේදී, එකී රැස්වීමේදී ඉදිරිපත් කරන ලද යෝජනා පිළිබඳව සැලකිල්ලට ගැනීමටත් තීරණය වී ඇත. ඒ අනුව, එම කරුණු මත පදනම්ව "Films Sri Lanka" ආයතනය ස්ථාපිත කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම**

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද තීරණයට අනුගතව එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත වීමෙන් අනතුරුව, 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත මේ වන විට බලාත්මකව පවතී. එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවෙන් සම්මත වීමට පෙර ක්ෂේත්‍රයේ විශේෂඥයින් විසින් පනත් කෙටුම්පතේ ඇතැම් වගන්ති සම්බන්ධයෙන් සංශෝධන යෝජනා

කර තිබූ නමුත්, කාරක සභා අවස්ථාවේදී එවැනි සංශෝධන පනත් කෙටුම්පතට ඇතුළත් කිරීමට හැකියාවක් නොතිබුණි. ඒ අනුව, එකී සංශෝධන ඇතුළත් කරමින් 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා 2024-02-12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පතට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 17. දූෂණ විරෝධය පිළිබඳ ජාතික න්‍යාය පත්‍රය

වත්මන් රජය 2022 ජූලි මාසයේදී බලයට පත්වීමෙන් අනතුරුව පාලන ක්‍රමය උසස් කරමින් ද, දූෂණය ඉවත් කරමින් ද, රාජ්‍ය මූල්‍ය හා ණය තිරසාරභාවය නැවත ස්ථාපිත කිරීම සහ ආර්ථික පරිවර්තනය සිදු කිරීම සිය ප්‍රමුඛතම අරමුණු බවට පත් කර ගනු ලැබ ඇත. ඒ අනුව, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි විධිවිධාන සහ මූල්‍ය ක්‍රියාකාරී කාර්යසාධක බලකායේ ප්‍රමිතීන් වැනි අනෙකුත් අදාළ ජාත්‍යන්තර සම්මතයන් සහ පරිචයන් බලාත්මක කිරීම සඳහා අල්ලස් පනත (26 වන අධිකාරය), 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සහ 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශනය පරිච්ඡින්න කරමින් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත බලාත්මක කිරීම තුළින් දූෂණ විරෝධය පිළිබඳ ජාතික න්‍යාය පත්‍රය සඳහා පදනම සකස් කරනු ලැබ ඇත. එමෙන්ම, මේ වන විට අපරාධවලින් උපයාගත් දේපළ පිළිබඳ පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පාලන විනිශ්චය තක්සේරුවේ තාක්ෂණික සහාය පිළිබඳ වාර්තාවේ දක්වා ඇති දූෂණ විරෝධය සඳහා වන නෛතික, සංවිධානාත්මක සහ ක්‍රමෝපායික රාමුවට අනුකූලව පහත සඳහන් පියවරයන් දූෂණ විරෝධය පිළිබඳ න්‍යාය පත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරී අයිතමයන් වශයෙන් හඳුනා ගනු ලැබ ඇත:

* 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත බලාත්මක කිරීම.

* 2025-2029 කාලසීමාව සඳහා ජාතික දූෂණ විරෝධී සැලැස්මක් සංවර්ධනය කිරීම.

* 2018 අංක 19 දරන ජාතික විගණන පනත සංශෝධනය කිරීම.

* විලදායී හා විනිවිදභාවයෙන් යුතු වත්කම් ප්‍රකාශනයක් සහ බැඳියා පිළිගැටුම් කාර්ය ක්‍රමයක් ස්ථාපිත කිරීම.

* අපරාධ සහ මුදල් විශුද්ධිකරණය මඟින් උපයා ගත් ලැබීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා නව ක්‍රමවේද හඳුන්වා දීම.

* දූෂණයට අදාළ නඩු විමර්ශනය සහ නඩු පැවරීමේ කටයුතු ශක්තිමත් කිරීම.

* අර්ථලාභී අයිතිය පිළිබඳ නීතිමය රාමුව සවිමත් කිරීමට හැකි වන පරිදි 2007 අංක 07 දරන සමාගම් පනත සඳහා සංශෝධන හඳුන්වා දීම සහ අනෙකුත් අදාළ පියවරයන් ගැනීම.

* රාජ්‍ය ප්‍රසම්පාදනයේ විනිවිදභාවය සහතික කිරීම පිණිස රාජ්‍ය ප්‍රසම්පාදන නීතියක් බලාත්මක කිරීම.

* 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ සහ ආයෝජන මණ්ඩලය හරහා බදු නිදහස් කිරීම් ලබන සියලුම සමාගම් ප්‍රකාශයට පත් කිරීම.

* ආයෝජන ප්‍රවර්ධන කොන්දේසි පිරිවැයකරණය සහ යෝජනා ඇගයීම සඳහා පැහැදිලි සහ විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලියක් ප්‍රකාශයට පත් කරනු ලබන තෙක් 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත තාවකාලිකව අත්හිටුවීම.

* රජය සතු ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

* එක් එක් ආදායම් දෙපාර්තමේන්තු තුළ කෙටිකාලීන දූෂණ විරෝධී පිළිවෙත ආරම්භ කිරීම.

* සේවක අර්ථසාධක අරමුදල සඳහා නව කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

* බැංකු ක්ෂේත්‍රයේ මූල්‍ය අංශය අධීක්ෂණයට අදාළව නීති, රෙගුලාසි සහ ක්‍රියාපටිපාටි සංශෝධනය කිරීම.

* අධිකරණ සේවා කොමිෂන් සභාව බලාත්මක කිරීම.

* තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ශක්තිමත් කිරීම.

ඒ අනුව, දූෂණ විරෝධය පිළිබඳ න්‍යාය පත්‍රය දූෂණ විරෝධය පිළිබඳ රජයේ ජාතික න්‍යාය පත්‍රය ලෙස ප්‍රතිපත්තියක් වශයෙන් සම්මත කිරීමටත්, එකී න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු කරන ලෙස අදාළ සියලු බලධාරීන්ට නියම කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

18. **රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත් කෙටුම්පත**

රාජ්‍ය ආයතනයක් විසින් පූර්ණ හිමිකම දරනු ලබන, පවරන ලද, අත්කර ගන්නා ලද, පවරා ගන්නා ලද, දරන ලද හෝ උපයෝජනය කරන ලද මූල්‍ය නොවන නිශ්චල හෝ චංචල වත්කම් හඳුනා ගැනීම සහ ජාතික වත්කම් ලේඛනයක් සම්පාදනය කිරීම සඳහාත්, එකී ලේඛනය කලින් කලට යාවත්කාලීන කිරීම සඳහා සහ එම වත්කම්වල නිසි ප්‍රතිලාභ රාජ්‍ය ආයතන වෙත ලැබීම තහවුරු කිරීම සඳහා වන විධිවිධාන ඇතුළත් කරමින් රාජ්‍ය වත්කම් කළමනාකරණය පිළිබඳ නීතියක් හඳුන්වා දීම සඳහා 2022-10-17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

19. **1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කළ 2024 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම**

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ පනවනු ලැබ ඇති අංක 2390/19 දරන, 2024-06-28 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 09 දරන ආනයන හා අපනයන

(පාලන) රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

20. **2024 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ගැසට් කරන ලද නියමය පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

2024-04-29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් චයිනා හාබර් ඉංජිනියරින් කම්පණි (ලංකා) ලිමිටඩ්, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කිරීමට අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, එම සමාගම ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කරමින් අංක 2383/34 දරන 2024-05-09 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වන වගන්තිය යටතේ නියමයක් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී නියමය පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

21. **2024 අංක 36 දරන පනතේ විධිවිධාන ප්‍රකාරව ජාතික විදුලි උපදේශක සභාව සහ ජාතික පද්ධති ක්‍රියාකරු පිහිටුවීම**

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් විදුලිබල කර්මාන්තයේ කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා එහි ආයතනික ව්‍යුහය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා විධිවිධාන සලසා ඇත. ඒ යටතේ විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය, ජාතික පද්ධති ක්‍රියාකරු හා ජාතික විදුලිබල උපදේශක සභා පිහිටුවිය යුතුව තිබේ. මේ වන විට විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය ස්ථාපිත කරනු ලැබ ඇත. ඒ අනුව, එකී පනතේ විධිවිධාන පරිදි ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීමටත්, ජාතික පද්ධති ක්‍රියාකරු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමටත් අදාළව විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 22. 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම

පෞද්ගලික අංශයේ සේවකයින්ගේ ජාතික අවම වේතනය රුපියල් 17,500/- දක්වාත්, ජාතික අවම දෛනික වේතනය රුපියල් 700/- දක්වාත් වැඩි කිරීමට හැකි වන පරිදි 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම පිණිස 2024-03-25 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 23 බැංකුවල රන් ආභරණ උකසට තැබූ පුද්ගලයින්හට සහන සැලසීම

පසුගිය කාලය තුළ රට තුළ පැවති දරුණු ආර්ථික අර්බුදය ආර්ථිකයේ සෑම අංශයකටම සෘජුව හා වක්‍රව අහිතකර අන්දමින් බලපාන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රන් භාණ්ඩ උකස් කිරීම සීඝ්‍රයෙන් වැඩි වී ඇත. 2019 වර්ෂයේදී රුපියල් බිලියන 210ක් පමණ වූ උකස් අත්තිකාරම්වල හිඟ මුදල් ප්‍රමාණය 2024 මාර්තු මාසය වන විට රුපියල් බිලියන 571ක් පමණ දක්වා 172%ක වර්ධනයක් පෙන්නුම් කර තිබේ. එම තත්ත්වය සැලකිල්ලට ගෙන බලපත්‍රලාභී බැංකු මඟින් උකස් අත්තිකාරම් ලබා ගෙන ඇති අඩු ආදායම්ලාභී පුද්ගලයන් වෙත සහන සැලසීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ගනුදෙනුකරුවන් විසින් තනි පුද්ගල පදනම මත 2024 ජූනි මස 30 හෝ ඊට පෙර බලපත්‍රලාභී බැංකු මඟින් ලබා ගත් රුපියල් 100,000/- නොඉක්මවන උකස් අත්තිකාරම් සඳහා වාර්ෂිකව 10%ක උපරිමයකට යටත්ව, පොලී සහනාධාරයක් මහා භාණ්ඩාගාරය විසින් සලසා දීම පිණිස යෝග්‍ය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************